**හොරණ නගර සභාව - 2022**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

හොරණ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 සඳහන් ඡේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදිව සකස් කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරිමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2020,2021 හා 2022 වර්ෂයන්හිදී පරිත්‍යාග ලෙස ලද රු.2,506,714 ක් වූ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරිමේදී අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට බැර කිරිම වෙනුවට පරිත්‍යාග ගිණුමට බැර කර තිබු අතර පෙර වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ක්ෂය ලෙස හඳුනාගත යුතු පිළිවෙලින් රු.9,272 ක් හා රු.304,197 කට සමාන ප්‍රමාණයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරිම් ලෙස හඳුනාගෙන නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල අයභාර වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු රු.514,305 ක් වූ අළුත්වැඩියා වියදම් වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | අළුත්වැඩියා වියදම් වර්ෂයේ අයභාර වියදම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.297,659 ක් වූ පුස්තකාල විමර්ශන අංශයේ අභ්‍යන්තර වෙන් කිරිම් කෙරීගෙන යන වැඩ වියදම අයභාර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | - එම - | නිම නොකළ ව්‍යාපෘති කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අවසන් ගෙවීම් සිදු කර අතරැඳවුම් මුදල් නිදහස් කර තිබුණු ව්‍යාපෘති 17 කට අදාලව රු.732,163 ක් ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. | - එම - | අවසන් ගෙවීම් හා අතරැඳවුම් මුදල් නිදහස් කළ පසු ණයහිමි ගිණුමෙන් ඉවත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1988 නගර සභා ආඥා පනතේ 170 (2) වගන්තිය | හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙස දේපල තහනම් කිරීම් කර නොතිබුණි. | දේපල තහනමට ගැනීම් පිළිබඳ නිවේදන දේපළ 172 ක් සඳහා නිකුත් කර ඇති බව. | නගර සභා ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 | කැබ් රථයේ එන්ජිමට හානි සිදු කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරිමේ මාර්ගෝපදේශය | සභාව සතු ඉඩම් 08 ක් හා ගොඩනැගිලි 06 ක් වෘත්තීය තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී නිරවුල් කිරිමට කටයුතු කරන බව. | වත්කම් තක්සේරු කිරිමේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.25,910,915 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.30,700,416 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 22,768,542 | 20,183,756 | 19,505,649 | 9,832,486 | 29,545,100 | 20,920,344 | 18,421,617 | 9,237,657 |
| (ii) | කුලී | 40,464,200 | 7,615,802 | 14,041,766 | 4,184,462 | 39,564,782 | 8,766,382 | 9,287,995 | 6,621,661 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,290,500 | 481,000 | 2,571,030 | - | 2,790,000 | 462,000 | 2,160,052 | - |
| (iv) | වෙනත් ආදායම් | 15,705,750 | 349,966 | 18,678,418 | 119,278 | 30,627,109 | 420,160 | 10,647,390 | 289,277 |
| | | 82,228,992 | 28,630,524 | 54,796,863 | 14,136,226 | 102,526,991 | 30,568,886 | 40,517,054 | 16,148,595 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් කාල විශ්ලේෂණය අනුව අවුරුදු 01-03 අතර හිඟය රු.4,891,034 ක්ද, අවුරුදු 03-05 අතර හිඟය රු.1,460,648 ක් ද, අවුරුදු 05-10 අතර හිඟය රු.1,300,239 ක්වූ අතර අවුරුදු 10 ට වඩා වැඩි හිඟය රු.435,319 ක් විය. | කෝවිඩ් වසංගතය හේතුවෙන් දේපළ තහනම් කිරිමක් සිදු නොවූ නමුත් දැනට විනිග්‍රහ බලපත්‍ර නිකුත් කිරිමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට කුලී හිඟය රු.6,910,938 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.3,430,595 හෙවත් සියයට 50 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් ගෙවන ලෙසට ලිඛිතව දැනුම්දීම් සිදු කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.67,728,825 ක් විය. | 2023.03.31 වන විට රු.27,893,916 ක මුදලක් ලැබී ඇති බව දන්වමි. | හිඟ මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ පැරණි පොළ පරිශ්‍රයේ පිහිටි රෙදි කඩ හා පළතුරු කඩ කාමර 09 ක් වෙතින් 2021 ජනවාරි මස සිට අයවිය යුතු රු.1,608,588 ක් වූ විදුලි ගාස්තු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කර ගෙන නොතිබුණි. | හිඟ නිවේදන නිකුත් කර ඇතත් එම ගාස්තු වලින් කිසිදු මුදලක් අයවී නොමැති අතර මනු කියවීම නොලැබීම මත අයවිය යුතු ගාස්තුව ගණනය කිරිමට නොහැකි වී ඇති බව | හිඟ විදුලි ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කඩ කාමර ප්‍රයෝජනයට ගැනීමේ අයිතිය බදුදීම පිළිබඳ බදු ඔප්පුවේ කොන්දේසි 04 වගන්තිය ප්‍රකාරව මාස 03 ඉක්මවා හිඟ තිබූ කඩ කාමර සම්බන්ධයෙන් කටයුතු කර නොතිබූ අතර ගිවිසුමේ 07 වන වගන්තිය ප්‍රකාරව මූලික බදු කාලය අවුරුදු තුන ඉක්මවා යාමට පෙර ඉදිරි වසර 03 ක කාල සීමාවකට බදු කාලය දිර්ඝ කර ගැනීමකින් තොරව කඩ කාමර පවත්වාගෙන යන අවස්ථා 08 ක් නිරීක්ෂණය විය. | හිඟ ගාස්තු ගෙවා ගිවිසුම අළුත් කර ගන්නා ලෙස ලිඛිතව දැනුම් දී ඇති බව | කඩ කාමර ගිවිසුම් අළුත් කිරිමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015-2020 වර්ෂවලට අදාල කර්මාන්ත ණයහිමි ශේෂ රු.2,652,542 ක් සහ 2018 - 2020 වර්ෂවලට අදාල විවිධ ණයහිමි ශේෂ රු.2,348,755 ක් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2023 වර්ෂයේදි නිරවුල් කිරිමට කටයුතු කරන බව | ණයහිමි ශේෂ නිරවුල් කිරිමට කටයුතු කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිනි නිවන රථය ධාවනයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. | ගිනි නිවන රථය ලියාපදිංචිය පිළිබඳව තොරතුරු නොමැති බැවින් ධාවනයෙන් බැහැරව පවතින බව. | ලියාපදිංචිය පිළිබඳව තොරතුරු රැස් කර රථය ධාවනයට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයට පෙර මිලටගත් ලේඛනගත නොවූ ඉන්ටර්කොම් දූරකතනන 08 ක්ඌන උපයෝජිතව ගබඩාවේ පැවතුණි. | 2020.12.31 දින භාණ්ඩ සමීක්ෂණයට අනුව ප්‍රධාන ඉන්වෙන්ට්‍රියට ඇතුලත් කරන බව. | දූරකතන භාවිතයට ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඉඩම් ලේඛනය තුල ඇතුලත් ඉඩම් 41 ක අයිතිය සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | සභාව වෙත පවරා ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව. | සභාව සතු ඉඩම් පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |